## උපරිමාධිකරණ සංකීර්ණ කළමනාකරණ මණ්ඩලය

### 1. මූල්‍ය ප්‍රකාශන

#### 1:1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2012 දෙසැම්බර් 31 දිනට උපරිමාධිකරණ සංකීර්ණ කළමනාකරණ මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

#### 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.

##### 1.2.1 ගිණුම්කරණ අඩුපාඩු

වර්ෂය අවසාන දිනට ගබඩාවේ පැවති දුරකථන පද්ධති අමතර කොටස් අයිතම් 132 ක වටිනාකම ගණනය කර අවසන් තොගයට ගෙන නොතිබුණි.

##### 1.2.2 ගෙවියයුතු ගිණුම්.

සමාලෝචිත වර්ෂය අවසන් දිනට පැවති රු. 574,254 ක් වූ ණයහිමි ශේෂයෙන් රු. 283,970 ක් වර්ෂ 05 කට වැඩි කාලයකට ද, රු. 32,086 ක් වර්ෂ 01 සිට 05 දක්වා වූ කාලයකට ද අදාල වූ අතර, එම ශේෂ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

##### 1.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම.

පහත දැක්වෙන ගිණුම් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවුණි.

| ගිණුම් විෂයය | වටිනාකම රු. | ඉදිරිපත් නොකල ලිඛිත සාක්ෂි |
|---|---|---|
| (අ) වෙනත් ලැබිය යුතු | 2,821,455 | ශේෂ සනාථකිරීමේ ලිපි |
| (ආ) වෙනත් ගෙවිය යුතු | 10,421,687 | ශේෂ සනාථකිරීමේ ලිපි |
| (ඇ) ඉඩම් | 4,788,000,000 | හිමිකම් ඔප්පු |

**1.2.4 නීති, රීති හා රෙගුලාසි වලට අනුකූල නොවීම.**

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) මුදල් රෙගුලාසි 802(3) | වාහන හා යන්ත්‍රෝපකරණ සම්බන්ධයෙන් ලේඛනයක් පවත්වාගෙන ගියද, එහි වාහන මිලට ගත් දිනය,පිරිවැය, යනාදී විස්තර ඇතුළත් කර නොතිබුණි. |
| (ආ) 2002 නොවැම්බර් 28 දින හා අයි.ඒ.අයි/2002/02 දරණ භාණ්ඩාගාර චක්‍රලේඛය | චක්‍රලේඛ උපදෙස් වලට අනුව පරිගණක ස්ථාවර වත්කම් ලේඛනය පවත්වා ගෙන ගොස් නොතිබුණි. |
| (ඇ) ආයතන සංග්‍රහයේ VIII වැනි පරිච්ඡේදයේ 3.1 සිට 3.6 වගන්ති | සාමාන්‍ය වැඩකටයුතු වලින් පරිබාහිර වූද, හදිසිවූද, සාමාන්‍ය රාජකාරී කාලය තුළ කළ නොහැකි වැඩ සඳහා අතිකාල වෙනුවෙන් මුදල් වැය කළ යුතු වුවත්, මණ්ඩලයේ කාර්ය මණ්ඩලය දිගින් දිගටම අතිකාල වැඩවල යොදවා සමාලෝචිත වර්ෂය තුළදී ඒ වෙනුවෙන් රු.4,453,905 ක් ගෙවීම් කර තිබුණි . |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මණ්ඩලයේ මෙහෙයුම් කටයුතු වලින් රු. 11,497,626 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 1,228,632 ක් විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ රු. 10,268,994 ක පිරිහීම සඳහා අනෙකුත් මෙහෙයුම් වියදම් රු. 9,042,217කින් වැඩිවීම විශේෂයෙන් බලපා තිබුණි.

**2.2 ඌනතාවය සීග්‍රයෙන් වැඩි වීම**

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ දෙකක මූල්‍ය ප්‍රතිඵල සැසඳීමේදී මණ්ඩලයේ ඌණතාවය සීග්‍ර ලෙස වැඩි වීම සමුච්චිත අරමුදලට අහිතකර ලෙස බලපා තිබුණි. විස්තර පහත දැක්වේ.

| වර්ෂය | ඌණතාවය | සමුච්චිත අරමුදලට බලපෑම |
|---|---|---|
| | රු. | රු. |
| 2010 | 894,478 | 43,330,279 |
| 2011 | 2,483,781 | (79,475,324) |
| 2012 | 11,915,862 | (197,936,899) |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්ය සාධනය

ක්‍රියාකාරී සැලැස්ම අනුව 2012 වර්ෂයේදී කාර්යයන් 18 ක් ඉටුකිරීමට ඇස්තමේන්තු කළද, ඉටු කරගැනීමට හැකිවී තිබුණේ කාර්යයන් 07 ක් පමණි.

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ විදුලි වියදම රු.38,287,039 ක් ව පැවති අතර, එය මුළු උපයෝගිතා වියදමින් සියයට 87 කි. මේ පිළිබඳව පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

i. විදුලි වියදම පාලනය කිරීම සඳහා ගතයුතු දිගුකාලීන ස්ථිර විසඳුම ලෙස මධ්‍යම වායු සමීකරණ පද්ධතියේ කාර්යක්ෂමතාව වැඩි කිරීම එකම විසඳුම බව කළමනාකරණය විසින් තිරණය කර තිබු නමුත් ඒ සඳහා සුදුසු වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කර නොතිබුණි.

ii. 2012 පෙබරවාරි 16 දිනැති අංක 156 දරන අයවැය චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව, 2012 වර්ෂයේ ඉන්ධන හා විදුලිය සඳහා සලසා දී ඇති ප්‍රතිපාදන සීමාව ඇතුළත අදාල වියදම් කළමනාකරණය කරගත යුතු විය. සමාලෝචිත වර්ෂයේ මණ්ඩලයේ විදුලිය වියදම රු.38,287,039 ක් වුවද, ඒ සඳහා මුලු ප්‍රතිපාදනය රු. 27,890,000 ක් වූයෙන් රු.10,397,039 කින් ප්‍රතිපාදන ඉක්මවා වියදම් දරා තිබුණි.

iii. විදුලි බිල්පත් නියමිත දිනට නොගෙවීම හේතුවෙන් රු. 114,191 ක් දඩ මුදල් වශයෙන් විදුලිබල මණ්ඩලයට ගෙවා තිබුණි.

**4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

කෙටුම්පත් මූල්‍ය ප්‍රකාශන පිළිබඳව නියැදි පරීක්ෂාවේදී අනාවරණය වූ රු. 883,151 ක ගිණුම්කරණ අඩුපාඩු මණ්ඩලයේ මාර්ෂල්වරයාගේ අවධානයට යොමු කරවන ලදී. ඒ අනුව එම ගිණුම්කරණ අඩුපාඩු නිවැරදි කර මූල්‍ය ප්‍රකාශන නැවත ඉදිරිපත් කළත්, නියැදියට පරිබාහිරව තවදුරටත් ගිණුම්කරණ අඩුපාඩු තිබීමට ඇති හැකියාව බැහැර කළ නොහැක.

**5. පද්ධති හා පාලනය**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර මණ්ඩලයේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කළ යුතුවේ.

(අ) ගිණුම්කරණය හා මුල්‍ය පාලනය

(ආ) වත්කම් පාලනය